




# ධීවර හා ජලජීවී රෝපණයේ වැදගත්කම හඳුනා ගනිමු

ඕනෑම සත්වයකුගේ ශරීරය තුළට අවශ්‍ය අවම ප්‍රෝටීන් ප්‍රමාණයක් ඇත.
මෙහිදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායක මත පුද්ගලයකු අවම වශයෙන් දිනකට ප්‍රෝටීන් 75ට ලබාගත යුතුය.
නමුත් ලංකාවේ පුද්ගලයකුගේ දෛනික පරිභෝජනය 38ට - 45ට ප්‍රමාණයක් අතර වේ.
මෙහිදී පරිභෝජනය කළ හැකි ප්‍රෝටීන් ප්‍රභව අතර මස්, මාළු, මාංශ බෝග ඇට වර්ග ආදිය දැකිය හැකිය.
නමුත් ප්‍රෝටීන් ආදේශකයක් ලෙස පහසුවෙන් භාවිත කළ හැකි ප්‍රභවයක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයන් දැක්විය හැක.
තායිලන්තයෙහි එක් පුද්ගලයකු වර්ෂයකට මත්ස්‍ය පරිභෝජනය 35Kg වන විට ශ්‍රී ලාංකික පුද්ගලයකුගේ එය 19g-22Kg වේ.
මේ නිසා ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහල දැම්මට නම් මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකළ යුතුය.
මස් වර්ගවල මිලද ඉහළ යන අතර, ඒ වෙනුවට ආදේශක ලෙස මාළු පරිභෝජනය කළ හැක.
ජලජීවී වගාවට සුදුසු ජලජ ප්‍රභව සුලබ වීම කලපු/වැව්/පොකුණු යනාදිය
ස්වයං රැකියාවක් ලෙස ජලජීවී වගාව කළ හැකිවීම - පොකුණු තුළ මසුන් වගා කිරීම

ඕනෑම සත්වයකුගේ ශරීරය තුළට අවශ්‍ය අවම ප්‍රෝටීන් ප්‍රමාණයක් ඇත.

මෙහිදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායක මත පුද්ගලයකු අවම වශයෙන් දිනකට ප්‍රෝටීන් 75g ලබාගත යුතුය.

නමුත් ලංකාවේ පුද්ගලයකුගේ දෛනික පරිභෝජනය 38ට - 45g ප්‍රමාණයක් අතර වේ.

මෙහිදී පරිභෝජනය කළ හැකි ප්‍රෝටීන් ප්‍රභව අතර මස්, මාළු, මාංශ බෝග ඇට වර්ග ආදිය දැකිය හැකිය.

නමුත් ප්‍රෝටීන් ආදේශකයක් ලෙස පහසුවෙන් භාවිත කළ හැකි ප්‍රභවයක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයන් දැක්විය හැක.

තායිලන්තයෙහි එක් පුද්ගලයකු වර්ෂයකට මත්ස්‍ය පරිභෝජනය 35Kg වන විට ශ්‍රී ලාංකික පුද්ගලයකුගේ එය 19g-22Kg වේ.

මේ නිසා ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහල දැම්මට නම් මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකළ යුතුය.

මස් වර්ගවල මිලද ඉහළ යන අතර, ඒ වෙනුවට ආදේශක ලෙස මාළු පරිභෝජනය කළ හැක.

ජලජීවී වගාවට සුදුසු ජලජ ප්‍රභව සුලබ වීම කලපු/වැව්/පොකුණු යනාදිය

ස්වයං රැකියාවක් ලෙස ජලජීවී වගාව කළ හැකිවීම - පොකුණු තුළ මසුන් වගා කිරීම

විදේශ විනිමය ලබා ගැනීමේ ප්‍රභවයක් ලෙස මැදිහත්වීම

කරවල/මාළු අපනයනය කිරීම නිසා ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබාගත හැකිවීම.

විසිතුරු මසුන් අපනයනය කිරීම මගින්ද ආදායමක් ලැබීම

පහත දැක්වෙන්නේ වසර කිහිපයක විසිතුරු මත්ස්‍ය අපනයනයෙන් ලැබුණු ආදායමයි.

| වර්ෂය | අපනයන ආදායම(රු.මිලියන) |
|---|---|
| 1983 | 28 |
| 2007 | 906 |
| 2012 | 960 |

කෘෂිකාර්මික වගාවට නුසුදුසු ඉඩම් බොහෝමයක් තිබීම හා ඒවා ජලජීවී වගාවට යොදාගත හැකිවීම.

වී වගාවට යොදා ගත නොහැකි කුඹුරු තුළ පොකුණු සාදා විසිතුරු මසුන් ආහාරමය මසුන් වගා කළ හැක - හාල් කුඹුරු

ගෘහ ආශ්‍රිතව සුරතල් සතුන් ලෙස ඇතිකළ හැක - විසිතුරු මසුන්

නාගරික කාර්ය බහුල ජීවන රටා හා බැඳුණු ආතති තත්ත්වයන් ගෙන් බැහැරවීමට ප්‍රයෝජනවත් වීම

විසිතුරු මත්ස්‍ය ටැංකිය

ලංකාවේ විවිධ ප්‍රදේශවල වගා කළ හැකි මත්ස්‍ය



විශේෂ සිටීම

කෙටි කාලයකදී ආදායම් ලබාගත හැකිවීම

දල දේශීය නිෂ්පාදනයට ධීවර අංශයේ දායකත්වය 2-3% අතර වේ.

| වර්ෂය | කරදිය (මෙ.ටො) | මිරිදිය (මෙ.ටො) | කිවුල්දිය (මෙ.ටො) |
|---|---|---|---|
| 2005 | 63000 | 32830 | 66710 |
| 2006 | 121360 | 35290 | 94620 |
| 2007 | 130110 | 38380 | 102560 |
| 2008 | 163320 | 44790 | 109510 |

ධීවර අංශය මගින් පහත දායකත්වයන්ද දක්වයි.

ආහාර සුරක්ෂිතභාවය සඳහා මැදිහත්වීම

රැකියා ලබාදීම

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය 500000

රැකියාලාභීන් 539960

ජල දේහ වර්ගීකරණය

පරිසර පද්ධති අතර ජලජ පරිසර පද්ධති ඉතා සුවිශේෂ පද්ධති වේ.

සම්භවය අනුව ස්වාභාවික ජලජ පරිසර පද්ධති හා කෘත්‍රිම පද්ධති ලෙස කොටස් 2 කට බෙදේ.

ඉහල ජෛව විවිධත්වයක් ඇති ස්වභාවික ජලජ පරිසර පද්ධති ප්‍රධාන වශයෙන් ආකාර 3 කි.

කරදිය පරිසර පද්ධතිය (ජලයෙහි ලවණතාවය 33ppm-35ppm)

කිවුල්දිය පරිසර පද්ධති (ජලයෙහි ලවණතාවය 0ppm-33ppm)

මිරිදිය පරිසර පද්ධති (ජලයෙහි ලවණතාවය 0 ppm - ආසන්න වශයෙන්)

වර්ග කිලෝ මීටර් 65000 ක භූමි භාගයකින් යුත් ලංකාවේ ජලජ පරිසරය ඉතාම වැදගත්ය.

කරදිය පරිසර පද්ධතිය (ජලයෙහි ලවණතාවය 33ppm-35ppm)

ලංකාව සතු මුළු සාගර ප්‍රදේශය වර්ග කිලෝමීටර් 536000LKm

මෙම ප්‍රමාණය ගොඩබිම මෙන් 8 ගුණයක් වේ.

මෙහිදී සාගරය ආකාර 3 කට බෙදේ.

1. මහාද්වීපික
2. අත්වෙරල
3. ගැඹුරු මුහුදු

මෙම ලිපියේ ඉතිරි කොටස ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

**පේමසිරි ජාසිංආරච්චි**
දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරි
ශ්‍රී ලංකා ජාතික ජලජීවී
වගා සංවර්ධන අධිකාරිය